www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ අභාවයට යන පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය

## The decay of parliamentary democracy in Sri Lanka

**කේ. රත්නායක විසිනි**
**2010 පෙබරවාරි 26**

"කරුනාකර අපට ගෞරවනීය මන්ත්‍රීවරුන් ලබා දෙන්න" යන හිසින් පෙබරවාරි 21 දින සන්ඩේ ටයිම්ස් පත්‍රයේ පලවූ කතුවැකිය, පාර්ලිමෙන්තුවේ බෙලහීනත්වය හා මන්ත්‍රීවරුන්ගේ පහත් තත්වය පිලිබඳව විලාප නගයි. මුලු රටම අප්‍රේල් 08 දිනට නියමිත පාර්ලිමේන්තු මැතිවරනයට සූදානම් වන අතර වාරයේ මෙම කතුවැකිය, දේශපාලන සම්මතයන්ගේ ප්‍රගතියක් වෙනුවෙන් කෙරෙන ආයාචන, අදහස් හා ප්‍රකාශ බොහොමයක් අතුරින් තවත් එකකි.

සියලුම ප්‍රධාන දේශපාලන පක්ෂ හා ආන්ඩුවේ ආයතන වෙතින් ඡන්දදායකයන්ගේ පුලුල් ස්තරයන් පිටමං වෙමින් සිටින හා ඒවාට වෛර කරන බව පවා, මාධ්‍ය විසින් පැහැදිලිව හඳුනාගෙන තිබේ. එවන් ලිපිවල අරමුන වන්නේ, මෙම ආකල්පයන් යටින් ඇති හේතු සාධක පිලිබඳව කුමන හෝ සමීප විමසුමක් කිරීම වලක්වා ලීමයි. සැබෑ හේතු පවත්නේ ලාභ පද්ධතියේම අර්බුදය තුලයි.

"ප්‍රගතිශීලී නීති සම්පාදනය කෙසේ අදාල කරගන්නේ ද යන්න පෙන්නුම් කරන කිසිවක්, පැවති පාර්ලිමේන්තුවෙන් සොයාගත නොහැකිවූ" බව කතුවැකිය පටන්ගැනීමේදී සඳහන් කරයි. බොහෝ නීතිවලට අඩංගු වූයේ සුලු සංශෝධනයන් බවත්, මන්ත්‍රීවරුන්ගෙන් වැඩි හරියක් "විධායකය විසින් තුට්ටුවකටවත් මායිම් නොකල යෝජනා ඉදිරිපත් කල කමිටු වල හිඳිමින් සිය කාලය ගත කල අතර, හදිසි නීතිය දීර්ග කරමින් හා එකිනෙකා සමඟ සංඩුසරුවල් කරගත්හ." වෙනත් වචන වලින් කිව හොත් එම පාර්ලිමේන්තුව, ආන්ඩුවේ බෙලහීන රබර් මුද්‍රාවක් බවට පත්ව තිබුනි.

සන්ඩේ ටයිම්ස් ඉදිරිපත් කරන්නේ අති සරල පැහැදිලි කිරීමකි. පාර්ලිමේන්තුවේ මෙම ගුනාත්මක පරිහානියට ප්‍රධාන හේතුව වී ඇත්තේ, එයට පිවිසෙන පුද්ගලයන්ගේ නැනවත්කම පහත වැටීමයි. පාර්ලිමේන්තුව තුල, නීතිඥයන්ගේ, ව්‍යාපාරිකයන්ගේ, ගුරුවරුන්ගේ හා රජයේ සේවකයන්ගේ සංඛ්‍යාව පහත වැටීම හා වෘත්තීය දේශපාලඥයන්ගේ ප්‍රමානය වැඩිවීම පිලිබඳ ගනන් හිලව් දැක්වීමෙන් අනතුරුව, වඩා හොඳ අපේක්ෂකයන් තෝරා ගන්නා ලෙස එය පක්ෂ නායකයන්ගෙන් බයාදු ලෙස ඉල්ලා සිටියි. අවසාන විග්‍රහයේදී කතුවැකිය, බුද්ධිමත් හා ආත්ම ගරුත්වයක් ඇති අපේක්ෂකයන් තෝරාපත්කර ගැනීම වෙනුවට, ලාභ ප්‍රයෝජන ගැනීමේ අපේක්ෂාවෙන් කටයුතු කිරීම පිලිබඳව ඡන්දදායකයන්ට දෝෂාරෝපනය කරයි.

යථාර්තය නම්, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ පරිහානිය, ඡන්දදායකයන්ගෙන් ඉමහත් බහුතරය වන වැඩකරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය හා සමාජ අපේක්ෂාවන් ඉටුකරලීමේ කිසිදු හැකියාවක් පාලක පන්තිය සතුව නොතිබීමේ කාරනය සමඟ, නොවෙන්කල හැකි ලෙස බැඳී පවතින්නේ ය යන්නයි. 2005 වසරේදී යාන්තමින් ජයගත් ජනාධිපති මහින්ද රාජපක්ෂ, එල්ටීටීඊයට එරෙහිව යුද්ධය අලුතෙන් ආරම්භ කිරීම හා ආර්ථික බර පැටවීම හැරෙන්නට වෙන කිසිවක් අත්කර දුන්නේ නැත. පසුගිය මැයි මාසයේදී එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසුව ඔහු, සාමය හා සමෘද්ධිය පොරොන්දුවූ නමුත් ජීවන තත්වයන් තව දුරටත් පිරිහී ගියේය.

රාජපක්ෂ වාරු වූයේ එන්ට එන්ටම දැඩි වන ආඥාදායකත්වයේ පාලන ක්‍රමෝපායන් මතය. ඔහු ක්‍රියාත්මක වූයේ ඥාතීන්, සමීප ආධාරකරුවන්, ඉහල නිලධාරීන් හා හමුදා ජෙනරාල්වරුන්ගෙන් සමන්විත කල්ලියක් තුලින් හා අස්ථාවර පාර්ලිමේන්තු බහුතරයක් මත වාරු වෙමින්ය. එය පවත්වාගෙන ගියේ, ආන්ඩුවේ සියලුම මනත්‍රීවරුන්ට කුමන හෝ ඇමති තනතුරක් පිරිනැමීම මඟින්ය. එහි ප්‍රතිපලයක් වශයෙන් ජනාධිපති, සිය විශාල කැබිනට් මන්ඩලය මෙන්ම පාර්ලිමේන්තුව ද බොහෝකොටම නොතකා හලේය.

වර්ගවාදී, මිලිටරිවාදී හා වෙලඳපොල ප්‍රතිසංස්කරන වෙත නැඹුරුවූ ඔහුගේ න්‍යාය පත්‍රය සමඟ එකඟත්වයෙන් කටයුතු කල එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුන යන විපක්ෂයේ ප්‍රධාන පක්ෂ වෙතින් රාජපක්ෂට, පාර්ලිමේන්තුව තුලදී විරුද්ධත්වයක් පල නොවුනු තරම්ය. ජනවාරි 26 දින ජනාධිපතිවරනයෙන් රාජපක්ෂ දෙවන වරටත් සිය තනතුර රැකගත්තේ, විපක්ෂයේ අපේක්ෂකයා වශයෙන්

තෝරාගෙන තිබුනු, රාජපක්ෂගේ යුද්ධය නිර්දය ලෙස පෙරට ගෙන ගිය ජෙනරාල් සරත් ෆොන්සේකා හා ඔහු අතර සැබෑ වෙනසක් ඡන්දදායකයන්ට දැකගත නොහැකිවූ බැවින්ය.

පිරිහෙන පාර්ලිමේන්තු සම්ප්‍රදායන් පිලිබඳව මැසිවිලි නඟන නමුත් සන්ඩේ ටයිම්ස් පත්‍රය, ආන්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම හා විපක්ෂය මැඩීමේ මැරවර ක්‍රියා පිලිබඳව කිසිවක් නොකියයි. ජනාධිපතිවරනයෙන් පසුව රාජපක්ෂ, කුමන්ත්‍රනයක් සැලසුම් කලේය යන තහවුරු නොකල චෝදනා මත ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමෙන් කුලුගැන්වුනු රුදුරු කඩාපැනීමක්, විරුද්ධ පක්ෂ, මාධ්‍ය විවේචකයන් හා විපක්ෂ වෘත්තීය සමිති නිලධාරීන්ට එරෙහිව දියත් කලේය. පාර්ලිමේන්තු මැතිවරනය පැවැත්වෙන්නේ, අඩන්තේට්ටම් කිරීමේ හා බියගැන්වීමේ මෙම දේශපාලන වාතාවරනය තුලය.

ව්‍යවස්ථාව වෙනස්කිරීමට හැකිවන පරිදි පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් ලබාගැනීම, ආන්ඩුවේ ප්‍රකාශිත අරමුනව තිබේ. ඇමතිවරුන් පත්කිරීම, අස්කිරීම මෙන්ම, සමස්තයක් ලෙස ආන්ඩුව ම බලයෙන් පහ කිරීමට අවශ්‍ය අසීමිත බලතල දැනටමත් ජනාධිපති සතුව තිබේ.

පාර්ලිමේන්තුව විසින් වතාවතක් ලෙස අලුත් කරන හදිසි නීති බලතල යටතේ ජනාධිපතිට අතිරේක විධායක බලතල හිමිවෙයි. එයට, මාධ්‍ය වාරනය හා වෘත්තීය ක්‍රියාමාර්ග තහනම් කිරීමේ බලතල ද ඇතුලත්ය. ආන්ඩුව ව්‍යවස්ථාව වෙනස් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ, වෙන කිසිවකට නොව, තවදුරටත් රාජපක්ෂගේ බලය සුරක්ෂිත කිරීම හා ඔහුගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමෝපායන් නීතියුක්ත කිරීම සඳහා ය.

අවසන් විග්‍රහයේදී පොලිස්-රාජ්‍යයක් සඳහා වන රාජපක්ෂගේ මෙම පියවර ඉලක්ක කෙරෙන්නේ, විරුද්ධ පක්ෂ වලට නොව, කම්කරු පන්තියට එරෙහිව ය. නය බරින් මිරිකී සිටින ආන්ඩුවට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් නය ගැනීමට බල කෙරුනු අතර, මැතිවරනය අවසන්වූ වහාම දැනට ග්‍රීසියේ සිදුවෙමින් තිබෙන ආකාරයට, වැඩකරන ජනතාවගේ සමාජ තත්වයේ ගැඹුරු කප්පාදුව සඳහා පියවර ගැනීමටත් ඔහුට බලකෙරෙනු ඇත. විශේෂයෙන්ම විදේශ ප්‍රතිපත්තියේ යොමුව පිලිබඳ උපායික වෙනස්කම් හැරෙන්නට, විරුද්ධ පක්ෂ වලට රාජපක්ෂගේ ආර්ථික න්‍යාය පත්‍රය හා ඔහුගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවේදයන් පිලිබඳව මූලික මතභේදයන් ඇත්තේ නැත.

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුල ලැගුම්ගත් " මහත්මා දේශපාලඥයින්ගේ" පාලනය ගැන සඳහන් කරමින් සන්ඩේ ටයිම්ස් පත්‍රය ලුහුබඳින්නේ අතීත මිත්‍යාවන් පසු පසය. දිවයිනේ දූෂිත පාලක ප්‍රභූ පැලැන්තියේ නියෝජිතයන් වන මේ "මහත්වරු" ආරම්භයේ පටන්ම, වැඩකරන ජනතාව බෙදීම සඳහා වර්ගවාදී දේශපාලනය යොදාගත් අතර, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කෙරෙහි පූර්න සතුරු ආකල්පයකින් ක්‍රියා කලහ. 1948 දී එවකට පාර්ලිමේන්තුව ගත් ප්‍රථම පියවරක් වූයේ, ජනගහනයෙන් සියයට දහයක් පමනවූ දෙමල කථාකරන වතු කම්කරුවන් දශ ලක්ෂයකගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම ය.

පසු කාලයක දී ලංකා සම සමාජ පක්ෂය සමඟ එක්සත්වූ බොල්ශෙවික් ලෙනින්වාදී පක්ෂයේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය පමනක්, මෙම දුරදිග යෑමේ විභවය සහිත ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරට විරෝධය දැක්වූහ. එවකට ධනපති මාධ්‍ය, නිසැක ලෙසම එම මන්ත්‍රීන් "මහත්වරු" ලෙස හැඳින්වූයේ නැත. ඔවුහු, සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත, වැඩකරන ජනතාවගේ අයිතීන් හා පන්ති අවශ්‍යතා වෙනුවෙන් සටන්වැදීම සඳහා කම්කරුවන් බලමුලු ගැන්වීමේ මාධ්‍යයක් ලෙස පාර්ලිමේන්තුව ප්‍රයෝජනයට ගත්, විප්ලවකාරී මාක්ස්වාදීන් වූහ.

ලසසපයේ පරිහානිය අතිශය තියුනු ලෙස ප්‍රකාශයට පත්වූයේ, 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) විසින් නායකත්වය දුන් ධනේශ්වර හවුල් ආන්ඩුවට එය ඇතුල් වීමෙන් කුලු ගැන්වුනු, පාර්ලිමේන්තු දේශපාලනයට හා ධනපති පන්තියේ පක්ෂ වලට එහි අනුගත වීම තුලය. ලසසපයේ පාවාදීම, කම්කරු පන්තියට එල්ල කෙරුනු දරුනු ප්‍රහාරයක් විය. එය ධනේශ්වර දේශපාලනයේ සන්ධිස්ථානයක් ද විය. මූලධර්මාත්මක කම්කරු පන්ති විපක්ෂයක් නොමැති වීමෙන්, පැවතියාවූ ධනපති පක්ෂ තුල පමනක් නොව, එල්ටීටීඊ හා ජවිපෙ වැනි සුලු ධනපති රැඩිකල් මෙවලම් තුල ද වර්ගවාදය හා අවස්ථාවාදය ඔඩු දිවීමට අවස්ථාව සැලසීය. අවසානයේ එය මඟ පෑදුවේ 1983 සිවිල් යුද්ධය පුපුරා යාමටය.

යුද්ධයේ ආරම්භය, එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව විසින් ක්‍රියාවට නංවන ලද නිෂ්පාදනයේ භූගෝලීයකරනයෙහි පුලුල් ක්‍රියාවලියක කොටසක්වූ, වෙලඳපොල ගැති ප්‍රතිව්‍යුහකරනය වෙත නැඹුරුවීමේ පිලිවෙත සමඟ බැඳී තිබුනි. ගැටුම ප්‍රධාන කොටම දෙමල විරෝධී යුද්ධයක් නොවීය. එය, කම්කරු පන්තිය බෙදීම හා කුමන හෝ විරෝධයක් මැඩීම කරා යොමුව තිබුනි. ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ගේ හා වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන්හි අඛන්ඩ ඛාදනය සමඟ යුද්ධය අත්වැල් බැඳගත්තේය. ඒ සමඟ ම එය. ඡන්ද ගරාගැනීම සඳහා ඉතා නින්දිත හා ප්‍රතිපත්ති විරහිත ක්‍රමවේදයන් අනුයන, තව තවත් කැබිලිතිවී යන පක්ෂවල එකතුවක් තුල පිලිබිඹුව අත්කර ගන්නා, සමස්ත දේශපාලන සංස්ථාපිතය කෙරෙහිම වැඩෙන සතුරු භාවයක් මතුකර තිබේ.

මහත්මා දේශපාලඥයන්ගේ ආගමනය යනුවෙන් සන්ඩේ ටයිම්ස් යෝජනා කරන විසඳුම වනාහි, සරලව ම විකාරයකි. ජාමූඅ හා ජාත්‍යන්තර ප්‍රාග්ධනය විසින් ඉල්ලුම් කරන න්‍යාය පත්‍රය ක්‍රියාවට

නඟමින්, මෙරට ධනවත් ව්‍යාපාරික ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතා නිර්දය ලෙස ආරක්ෂා කිරීම සඳහා කිසිසේත් නොපසුබට වන නැඟී එන පොලිස්-රාජ්‍ය තන්ත්‍රයක් හමුවේ, පවතිනුයේ ඉමහත් පන්ති ආතතියකි.

කම්කරු පන්තිය අවශ්‍ය ඓතිහාසික පාඩම් උකහාගත යුතුය. එහි අවශ්‍යතා ආරක්ෂා කරගත හැක්කේ, පාර්ලිමේන්තුවාදී දේශපාලනයට අනුබද්ධව හා උපාමාරු වලින් නොවන අතර, සුලු පිරිසකගේ ලාභය සඳහා ද නොව, සිය සමාජ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සමාජය සමස්තයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුන සහිත සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත තමන්ම ස්වාධීනව බලමුලු ගැන්වෙමින් පමනි.

සමාජවාදී සමානතා පක්ෂය (සසප) අප්‍රේල් 08 දින මැතිවරනයට ඉදිරිපත් වන්නේ, රාජපක්ෂගේ එලඹෙන "ආර්ථික යුද්ධය" පිලිබඳව වැඩකරන ජනතාවට අනතුරු අඟවමින් ඔවුන් උගන්වා ගැනීමට හා ඊට එරෙහිව දශක ගනනාවක් තිස්සේ මඩිනු ලැබ පවතින පන්ති අරගලයේ ක්‍රමවේදයන් පනගැන්වීම සඳහාය. සසප සිය උද්ඝෝෂනය තුලදී වැඩකරන ජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා, වැඩපලවල ද කම්කරු පන්තික නිවහන් ප්‍රදේශයන්හි ද නගරවල හා ගම්වල ද ආරක්ෂක කමිටු ගොඩනැඟීම දිරිමත් කරනු ඇත. අපගේ අපේක්ෂකයන් සියලු ආකාරයේ ජාතිවාදයටත්, වර්ගවාදයටත් විරුද්ධ වන අතර, කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා ද ශ්‍රී ලංකාවේ, දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදී අරගලය සඳහා ද පදනම වශයෙන් සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන්ගේ එක්සත්කම සඳහා සටන් වදිනු ඇත.

© www.wsws.org